# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# ANNUAL REPORT
# 2020

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

தேசிய மொழிக் கல்வி மற்றும் பயிற்சி நிறுவனம்

National Institute of Language Education and Training

NILET

# ජාතික භාෂා අධ්‍යාපන පුහුණු ආයතනය

## වාර්ෂික වාර්තාව - 2020

## පටුන


| අනු අංකය | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|
| 1) | | ආයතනයේ පිහිටීම | 02 |
| | 1.1) | කොළඹ කාර්යාලය | |
| | 1.2) | අගලවත්ත පුහුණු ආයතනය | |
| 2) | | ආයතනයේ පරමාර්ථ | 03 |
| 3) | | ආයතනයේ කර්තව්‍යයන් | 04 |
| 4) | | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි 2020 වර්ෂය සඳහා නිර්දේශිත කාර්යමණ්ඩල තොරතුරු | 05 |
| 5) | | 2020 වර්ෂය සඳහා නිර්දේශිත අධ්‍යයන මණ්ඩල සාමාජිකයින් | 05 |
| 6) | | ආයතනයේ කාර්යමණ්ඩලය - 2020 | 07 |
| | 6.1) | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම | 07 |
| | 6.2) | ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය | 08 |
| | 6.3) | ආයතනයේ සංයුතිය | 09 |
| | 6.4) | පාලන අංශය | 09 |
| | 6.5) | සැලසුම් අංශය සහ පුහුණු අංශය | 11 |
| | 6.6) | ගිණුම් අංශය | 19-30 |
| 7) | | විගණකාධිපති වාර්තා | |

## 1. ආයතනයේ පිහිටීම

### 1.1) කොළඹ ප්‍රධාන කාර්යාලය

2020 වර්ෂයේ ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි ප්‍රධාන පරිපාලන කටයුතු සිදුකරගෙන යනු ලැබුවේ අංක 321/1/A, හයිලෙවල් පාරල මාකුඹුර, පන්නිපිටිය යන ලිපිනය දරන ස්ථානයෙහිය. දීප ව්‍යාප්ත, භාෂාව ඉගැන්වීම පිළිබඳ විවිධ පාඨමාලා සංවිධානය කිරීම සහ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, සියලු ආයතන හා අමාත්‍යාංශ සමඟ පහසුවෙන් කටයුතු කිරීම සහ ආයතනයෙහි සියලුම කර්තව්‍යන් වඩා පෘථුල වශයෙන් පවත්වාගෙන යාම සඳහා කොළඹ කාර්යාලය සංස්ථාපනය කර ඇත.

### 1.2) අගලවත්ත පුහුණු ආයතනය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි අගලවත්ත භාෂා මධ්‍යස්ථානය කොළඹ සිට කි.මී. 100ක් පමණ දුරින් කළුතර දිස්ත්‍රික්කයෙහි අගලවත්ත, ගලේවත්ත නම් ප්‍රදේශයෙහි ස්ථාපනය කොට ඇත.

ජාතික වැවිලි කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පැවති අක්කර 2.5ක පමණ භූමි ප්‍රමාණයක් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්න ලද තීරණයකින් අනතුරුව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය වෙත පවරා ඇති අතර, ආයතනයෙහි ආරම්භක අවදිය හා වැඩිදියුණුව සඳහාත් භූමි පරිශ්‍රය ප්‍රභල ලෙස හේතු වී ඇත. භාෂා ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රියාවලිය වඩා සෞන්දර්යානන්දව, ප්‍රායෝගිකව සහ බුද්ධිවාදී ස්වරූපයෙන් සිදු කළ හැකි මනෝරම්‍ය වූ පරිසර සොභාවයකින් සහ මනස්කාන්ත භූමි නිමවුමකින් යුක්ත අගලවත්ත භාෂා පුහුණු මධ්‍යස්ථානය නේවාසිකව ස්ථාපනය කර ඇත.



## 2. ආයතනයෙහි පරමාර්ථ

- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක්ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීම.
- ලිඛිත නීතියකින් පිහිටුවන ලද භාෂා පරිවර්තන සේවයෙන් සහ ජාතික භාෂණ පරිවර්තන සේවයෙන් පත් කළයුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවය ඇති පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තනයන් බිහි කිරීම.
- සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහි කිරීම.
- භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් පුහුණු කිරීමට සුදුසුකම්ලත් ගුරුවරුන් බිහි කිරීම.
- මහජනයාට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛභාෂා හැකියාව ඇති තැනැත්තන් පුහුණු කිරීම.



## <u>3. ආයතනයේ කර්තව්‍යයන්</u>

- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්හට සිංහල, දෙමළ ස ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ තැනැත්තන් බිහි කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දීර්ඝ පුහුණුවක් ලබාදීම.
- ආයතනයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ හා අ
- ධ්‍යයනවල ප්‍රතිඵල භාවිත කිරීමේ අරමුණු ඇතිව භාෂා පුහුණු කිරීමට අදාළව පවතින ගැටළු පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන පැවැත්වීම.
- සුදුසු තැනැත්තන්ට භාෂා පුහුණුව සහ අධ්‍යාපනය ලබාදීම සහ ඒ පුහුණුවීම් සහ අධ්‍යාපනය සම්පූර්ණ කරන සාර්ථක අපේක්ෂාවන්ට සහතිකපත්‍ර හා ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
- භාෂා ඉගැන්වීමේ කාර්යය සිදු කිරීම සඳහා පුහුණු පුද්ගලයන්ගේ සමන්විත මණ්ඩලයක් පිහිටුවීම.
- භාෂාවන්ට අදාළ කාරණා පිළිබඳ තොරතුරු තැම්පත් කර තබන ස්ථානයක් පිහිටුවීම.
- භාෂා පරිවර්තකයන්, භාෂණ පරිවර්තකයන් සහ ලඝු ලේඛකයින් ආදී වශයෙන් විශේෂ කාණ්ඩවලට අයත් තැනැත්තන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා වලින් විශේෂිත භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම.



## 4. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයෙහි 2020 වර්ෂය සඳහා නිර්දේශිත කළමනාකරණ මණ්ඩල තොරතුරු

ආයතනයෙහි පරමාර්ථ වඩා කාර්යක්ෂම සහ නිරවද්‍ය සිදුකරනු වස් අදාළ සියලුම තීරණවල තීරකයා වශයෙන් පෙනී සිටිනුයේ කළමනාකරණ මණ්ඩලයයි. 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතෙහි 3(1) වන වගන්තිය ප්‍රකාරව ගරු ඇමතිතුමා විසින් පහත සඳහන් කළමනකරණ මණ්ඩලය පත්කරනු ලැබ ඇත.

**2020 වර්ෂය මුළුල්ලේ පැවති කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් ආයතනයෙහි කටයුතු නියමිත පරිදි සිදු නොවූ අතර කළමනාකරණ මණ්ඩලයක් පත්වී නොතිබුණි.**

## 5. 2020 වර්ෂය සඳහා නිර්දේශිත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන්

2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන අංක 07 පරිච්ඡේදයට අදාළව ගරු අමාත්‍යතුමන් විසින් ආයතනයේ අධ්‍යයන කටයුතු වලදී සැලසුම්, ප්‍රතිපත්ති සහ නිර්දේශ සඳහා අවශ්‍ය කොන්දේසි සහ වෙනත් කාර්යයන් වඩා නිවැරදිව සහ කාර්යක්ෂමව සිදුකරනු වස් විවිධ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් භාෂාව, වාග් විද්‍යාව සහ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර අළලා පහත අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් පත් කරන ලදුව ඇත. එම විශ්වවිද්‍යාලවල ආචාර්ය සහ මහාචාර්යවරුන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ සංස්ථාපිත විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතු සිදු කරන, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවෙහි එකඟතාවයෙන් පත්කරන ලද අතර, ආයතනයෙහි ඉදිරි දැක්මෙහි ප්‍රධාන නියෝජිතයන් වශයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගනුවස් ඍජුව බැඳී සිටී.

**2020 වර්ෂය මුළුල්ලේ පැවති කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් ආයතනයෙහි කටයුතු නියමිත පරිදි සිදු නොවූ අතර අධ්‍යයන මණ්ඩලයක් පත්වී නොතිබුණි.**

## 5.1 අධ්‍යයන මණ්ඩලයේ කාර්යභාරය

- ආයතනයේ අධ්‍යයන කටයුතුවලට අදාළ වියහැකි යම් යම් කරුණු පිළිබඳ පනතේ විධානයන්ට අනුව ආයතනයට උපදෙස් දීම.
- ආයතනයේ රීතිවලට අනුකූල විභාග පැවැත්වීම සහ විභාග සමත් වී ඇති සහ ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් කොන්දේසිවලින් සෑහීමකට පත්ව ඇති ඩිප්ලෝමා සහතිකපත් සහ ආයතනයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තන් පිළිබඳව කළමනාකරණ මණ්ඩල වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ආයතනය වෙත මණ්ඩලය විසින් යොමු කරන ලද කිසියම් කරුණක් පිළිබඳව වාර්තා සැලකිල්ලට ගැනීම.
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පුහුණු වැඩසටහන් සඳහා වු පාඨමාලාවලට සහ විභාගවලට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පුහුණු වැඩසටහන් සඳහා වූ පාඨමාලාවලට අදාළ නීතිරීති සකස් කර කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- ආයතනයේ අධ්‍යයන මණ්ඩල පත්කිරීම, ඉවත් කිරීම සහ විනය පාලනයට අදාළ නීති, බඳවා ගැනීමේ පටිපාටි, වේතන, පරිශ්‍රමික දීමනා සහ ගාස්තු සහ සේවා කාලය, නිවාඩු ආදිය පිළිබඳව කළමනකරණ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශිෂ්‍යත්ව ප්‍රදාන, ශිෂ්‍යාධාර පදක්කම් සහ ත්‍යාග සඳහා සපුරාලිය යුතු කොන්දේසි පිළිබඳව කළමනාකරණ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ශිෂ්‍යත්ව ප්‍රදාන, ශිෂ්‍යාධාර පදක්කම් සහ ත්‍යාග සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද කොන්දේසි සපුරා ඇති තැනැත්තන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධ්‍යයන මණ්ඩලයේ අනු නියෝජිතයන්ගේ සැදුම්ලත් කමිටු පත්කිරීම.
- කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ සහ එවැනි රැස්වීම්වලදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටීන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 6. ආයතනයේ කාර්ය මණ්ඩලය - 2020

ආයතනයේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

කළමනාකරණ මණ්ඩලයෙහි විධානයන්ට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආයතනයෙහි පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලබයි.

1. ආයතනයේ පරිපාලන කටයුතු හා මූල්‍ය කළමනාකරණය පිළිබඳව වගකීම
2. ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලයෙහි පත්කිරීම්, ආයතනික පරිපාලන කටයුතු
3. ආයතනය විසින් පවත්වනු ලබන සියලුම පුහුණු වැඩසටහන් අධීක්ෂණය හා සම්බන්ධීකරණය

### 6.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

වර්ෂය තුලදී ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ සේවක සංඛ්‍යා කමිටුවෙහි නිර්දේශ ලබාගනිමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත සේවක පුරප්පාඩු සඳහා (තාවකාලික පදනමින්) බඳවා ගැනීම් සිදු කරන ලදි. මේ අනුව,

| නම | තනතුර | බඳවාගත් දිනය |
|---|---|---|
| 1) ඒ.එම්.එස්.එන්. අතපත්තු මයා | කළමනාකරණ සහකාර | 2020/03/02 |
| 2) මහේෂ් තැන්නේ මයා | කළමනාකරණ සහකාර | 2020/03/02 |
| 3) බී. ඉන්දික ප්‍රසන්න බණ්ඩාර මයා | කාර්යාල කාර්යය සහායක | 2020/03/02 |
| 4) කේ.එම්.ජී. බණ්ඩාරනායක මයා | කාර්යාල කාර්යය සහායක | 2020/03/02 |
| 5) එච්.එම්. කලණ විදුරංග බණ්ඩාර මයා | රියදුරු | 2020/03/02 |
| 6) එස්.ආර්.සී. ද සේරම් මෙය | සම්බන්ධීකරණ සහකාර | 2020/10/06 |
| 7) ටී.එස්. ශාන්ත ද සිල්වා මයා | කළමනාකරණ සහකාර | 2020/10/06 |
| 8) එච්.ජී.එන්.එන්. නිහාරි මෙය | කළමනාකරණ සහකාර | 2020/10/06 |
| 9) පී.ඩබ්.ඩී.ඩී.බී. තිලකරත්න මයා | කාර්යාල කාර්යය සහායක | 2020/10/06 |
| 10) බී.ජී.පී. කුමාරි මෙය | කාර්යාල කාර්යය සහායක | 2020/10/06 |
| 11) එල්. වීරසේකර මෙය | සම්බන්ධීකරණ සහකාර | 2020/12/18 |



## 6.2 ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය

| තනතුරු නාමය | | එකතුව |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2. | අධ්‍යක්ෂ | 02 |
| 3. | සහකාර අධ්‍යක්ෂ | 03 |
| 4. | ගණකාධිකාරී | 01 |
| 5. | අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි | 05 |
| 6. | පරිපාලන නිලධාරී | 01 |
| 7. | අභ්‍යන්තර විගණන නිලධාරි | 01 |
| 8. | සම්බන්ධිකරණ සහකාර | 10 |
| 9. | පුස්තකාලයාධිපති | 01 |
| 10. | කළමනාකරණ සහකාර | 12 |
| 11. | විදුලි කාර්මික හා පොම්ප ක්‍රියාකරු | 01 |

| | | |
|---|---|---|
| **12.** | රියදුරු | 06 |
| **13.** | කාර්යාල කාර්ය සහායක | <u>08</u> |
| | **මුළු එකතුව** | <u>52</u> |

මේ අනුව 2020 වර්ෂය අවසානයේදී ආයතනයේ සේවයේ යෙදී සිටි කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| <u>තනතුර</u> | <u>සංඛ්‍යාව</u> |
|---|---|
| 1. අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2. අධ්‍යක්ෂ | 01 |
| 3. සහකාර අධ්‍යක්ෂ | 02 |
| 4. ගණකාධිකාරි | 01 |
| 5. අධ්‍යයන හා පර්යේෂණ නිලධාරි | 05 |
| 6. පරිපාලන නිලධාරි | 01 |
| 7. අභ්‍යන්තර විගණන නිලධාරි | 01 |
| 8. සම්බන්ධීකරණ සහකාර | 10 |
| 9. කළමනාකරණ සහකාර | 12 |
| 10. රියදුරු | 06 |
| 11. කාර්යාල කාර්ය සහායක | <u>08</u> |
| **මුළු එකතුව** | **<u>48</u>** |

## 6.3 ආයතනයේ සංයුතිය

ආයතනයෙහි කාර්යයන් ඉටුකර ගැනීමේ පහසුව සඳහා එය පහත සඳහන් අංශවලට වෙන් කර ඇත.

## 6.4 පාලන හා සැපයුම් අංශය

ආයතනයේ කාර්ය මණ්ඩලයට අදාළ සියලුම පරිපාලන හා ආයතනික කටයුතු සිදු කිරීම මෙම අංශය මඟින් සිදු කරයි. ආයතනයේ සෙසු අංශවල කාර්යයන් බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් සපයා දෙමින්, අංශ අතර සම්බන්ධීකරණ කටයතු මනාව පවත්වාගෙන යාමද පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

එසේම ආයතනයේ අනෙකුත් සියලුම අංශවලට අවශ්‍ය කාර්යමණ්ඩලය නියමිත කාර්ය පටිපාටින් ඔස්සේ බඳවා ගැනීම, ඔවුන්ගේ ආයතනික සහ පරිපාලනමය කටයුතු ඉටුකරමින් සේවක සුබසාධනයත්, සේවක අභිප්‍රේරණයත් නංවාලමින් ඒ ඒ අංශවල කටයුතු ඵලදායි අන්දමින් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැලසීමද කාර්යයෙහි නියුක්තව සිටීමද පාලන අංශය මඟින් සිදු කරන කාර්යයකි. පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය වන පුහුණු උපකරණ සහ ආයතනයේ සියලුම අංශවලට අවශ්‍ය වන පරිගණක යන්ත්‍ර මෙන්ම කාර්යාලයට දෛනිකව අවශ්‍ය වන කාර්යාල උපකරණ, ලිපි ද්‍රව්‍ය ආදිය මිලදී ගැනීමටද, වාහන නඩත්තු, ප්‍රවාහන පහසුකම් සැපයීම, ආරක්ෂක සේවාවන් සහ පිරිසිදු කිරීමේ සේවා සම්පාදනය කිරීම ආදී සියලුම ප්‍රසම්පාදන කටයුතු ඉටුකරනු ලබන්නේද මෙම අංශය විසිනි. එමෙන්ම ආයතනයේ පුස්තකාලය හා ප්‍රලේකන මධ්‍යස්ථානය පරිපාලන අංශය යටතේ ක්‍රියාත්මක වේ.



## පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය හා ඊට අනුබද්ධ පුහුණු ආයතනයේ පුහුණු පාඨමාලා පවත්වාගෙන යන සම්පත්දායකයන්ට, පුහුණු පාඨමාලා සඳහා සහභාගිවන්නන්ට සහ පුහුණු පාඨමාලා පවත්වාගෙන යාම සඳහා සහාය වන ආයතනයේ කාර්ය මණ්ඩලයට දැනුම සහ තොරතුරු රැස්කර ගැනීම සඳහා ඉගෙන ගැනීමේ පහසුකම් පුස්තකාලය මඟින් සපයාගත හැකිය.

භාෂා පිළිබඳ අධ්‍යයන කටයුතු සඳහා විශේෂයෙන් උපකාරී වන විශේෂ පොත්පත්වලින් පරිපූර්ණ වී ඇති මෙම පුස්තකාලය පරිපාලන කළමනාකරණය, ගිණුම්කරණය, තොරතුරු තාක්ෂණය, භාෂාව, සාහිත්‍යය සහ සමාජ විද්‍යාව ආදී විෂයන් ආශ්‍රිත පොත්පත් සහ සඟරාවලින් සමන්විත වේ.

මෙයට අමතරව මෙම පුස්තකාලය ජාතික භාෂා ඉගැන්වීමේ ක්‍රියාවලියේදී අත්‍යවශ්‍ය උපකාර ග්‍රන්ථ, ශබ්දකෝෂ, විශ්වකෝෂ, පාරිභාෂික පදමාලා හා වාග්කෝෂ ආදී විමර්ශන කෘති, මෙන්ම පුහුණුවීම් සහ පුහුණු කිරීම්වලට අදාළ මෙවලම් කට්ටල, හා විවිධ ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ එකතුවකින්ද යුක්ත වේ.

මේ හැර දෙවන භාෂාවක් අධ්‍යයනය කිරීමේදී අවශ්‍ය වන ග්‍රන්ථ හා විමර්ශන ද්‍රව්‍ය පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක්ද මෙහි පවතී. චරිත ප්‍රධාන සහ අනුක්‍රමික සම්පාදනය මෙම පුස්තකාලය මඟින් ඉටු කරන තවත් සේවාවකි. මෙයට අමතරව භාෂාවලට අදාළ වූ කරුණු පිළිබඳ ප්‍රලේඛන මධ්‍යස්ථානයක් ලෙස විවිධ භාෂා පිළිබඳ ජාතික වශයෙන් සිදු කරන පර්යේෂණ සහ අධ්‍යයන සම්බන්ධයෙන් වූ පොත් එකතුවක්ද පුස්තකාලය සඳහා යාවත්කාලීන කර ඇත.

## 6.5 සැලසුම් අංශය සහ පුහුණු අංශය

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතන පනතේ සඳහන් අරමුණු සහ පරාමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීම වේ.

පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් ඇතුළු සැලසුම් සකස් කිරීම, මාසික ප්‍රගති වාර්තා, කාර්තු ප්‍රගති වාර්තා, වර්ෂ අවසානයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම සහ එම වාර්තා අදාළ අංශ වෙත යොමු කිරීම මෙම අංශයෙන් සිදුකෙරේ.

ඉහත කාර්යයන්ට අමතරව පවරනු ලබන විශේෂ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය**

**වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2020**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ත්‍රෛ භාෂා සංකල්පය ක්‍රියාවට නැංවීමේ අරමුණින් ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් 2007 අංක 26 දරණ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත අනුව ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය ප්‍රතිෂ්ඨාපනය කර ඇත.

ආරම්භයේදී එනම් 2007 නොවැම්බර් මස පළමුවැනි දින සිට මෙම ආයතනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැණුනු අතර ආයතනය එම අමාත්‍යාංශය පිහිටි, කොළඹ 03 ගාලු පාරේ අංක 310 යන ස්ථානයේ පවත්වාගෙන යන ලදි. 2010 අප්‍රේල් මස 25 වෙනි දින සිට අමාත්‍යාංශය ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය වශයෙන් නාම ගත කරන ලද අතර, මෙම ආයතනය එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන අතරට එක් විය.

2011 නොවැම්බර් 15 දින සිට ආයතනයේ ප්‍රධාන කාර්යාලය අංක 155/A, කාසල් වීදිය, කොළඹ 08 යන ස්ථානයේ පවත්වාගෙන ගිය අතර, 2013 සැප්තැම්බර් මස 03 වෙනි දින සිට 2015 පෙබරවාරි 28 දින දක්වා දෙවන මහළ, ගොඩනැගිලි අංක 09, බණ්ඩාරණායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07 යන ස්ථානයේද, 2017 මැයි 30 දින දක්වා අංක 40, බුත්ගමුව පාර, රාජගිරිය යන ස්ථානයේ පවත්වා ගෙන යන ලද අතර වර්තමානය වන විට අංක 321/1,හයිලෙවල් පාර ,මාකුඹුර යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබයි. මේ වන විට ආයතනය තම අරමුණු ඉටුකර ගැනීම සඳහා විශේෂ වැඩසටහන් හා පුහුණු පාඨමාලා දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරමින් පවතී. ඒවා අතරින් පහත සඳහන් වැඩසටහන් ප්‍රධාන වේ.

- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන් වලට අදාල විෂය නිර්දේශ පිළියෙල කිරීම.
- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා පුහුණු කරුවන් පුහුණු කිරීම.
- දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සහ දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව ක්‍රියාත්මක කිරීම.
- ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සම්පත් දායකයින් සඳහා පසු විපරම් සහ නියාමන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- භාෂා පරිවර්තනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා / ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරින් සඳහා අර්ධ කාලීන දෙවන භාෂා පුහුණු පාඨමාලා (I මට්ටම, II මට්ටම, III මට්ටම සහ IV මට්ටම) ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරීන් සහ අ.පො.ස (උ.පෙළ) නිම කළ සිසුන් සඳහා දින 12නේවාසික / නේවාසික නොවන කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

- අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා සිමාවාසික කාලය තුළ දී කෙටිකාලීන දෙවන භාෂා පුහුණු පාඨමාලා ක්‍රියාත්මකකිරීම. (වෛද්‍යවරුන්, ඉංජිනේරු වෘත්තිකයන් සහ අනෙකුත් වෘත්තිකයන් සඳහා)
- ගුවන් විදුලි නාලිකා හරහා භාෂා පුහුණු වැඩසටහන් ප්‍රචාරණය කිරීම.
- අ.පො.ස (සා.පෙළ) දෙවන භාෂා විෂය සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.

ආයතනය මඟින් සංවිධානය කරනු ලබන නේවාසික පාඨමාලා රාශියක් ගලේවත්ත, අගලවත්ත පිහිටි පුහුණු මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කරනු ලැබේ. රමණීය භූමි භාගයක පිහිටි මෙම පුහුණු ආයතනය පුහුණුවන්නන් 250ට පමණ එකවර සහභාගිවිය හැකි දේශන ශාලාවකින් ද, 30 දෙනෙකුට සහභාගී විය හැකි භාෂා විද්‍යාගාරයකින් ද, 60 දෙනෙකුට නවාතැන් පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාරයකින් හා පුස්තකාලයකින් ද සමන්විත වේ.

ඉහතින් සඳහන් කරන ලද පාඨමාලා දිපව්‍යාප්ව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවීණ සම්පත්දායක මණ්ඩලයක දායකත්වය ලබාගන්නා අතර ආයතනයේ කාර්ය මණ්ඩලයද ඒ සඳහා ඉමහත් කැපවීමකින් යුතුව කටයුතු කරනු ලබයි.

<u>දැක්ම</u>

ජාතික භාෂා පුහුණුව තුළින් ශ්‍රී ලාංකේය ජනතාව අතර සාමය සහ සහජීවනය වර්ධනය කිරීම.

<u>මෙහෙවර</u>

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස භාෂා අධ්‍යාපනය සහ පුහුණුව සඳහා තෙ භාෂා දැනුම් සම්පාදන කේන්ද්‍රස්ථානය ලෙසින් කටයුතු කිරීම.

<u>අරමුණු</u>

1. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම් ලබා ගැනීමට කැමැත්තෙන් සිටින්නේ යම් තැනැත්තෙක් ද එවැනි තැනැත්තන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහි කිරීම.

2. ලිඛිත නීතියකින් පිහිටුවන ලද ජාතික භාෂා පරිවර්තක සේවයෙන් පත් කළ යුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල නිපුණතාවයන් ඇති පරිවර්තකයින් සහ භාෂණ පරිවර්තකයින් බිහිකිරීම.

3. සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා වලින් භාෂා ගුරුවරුන්, භාෂා පරිවර්තනයින් සහ භාෂණ පරිවර්තකයින් පුහුණු කිරීමට සුදුසුකම් ලත් ගුරුවරුන් බිහිකිරීම.

4. මහජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ත්‍රෛ භාෂා හැකියාවැති තැනැත්තන් පුහුණු කිරීම.

## ආයතනයේ කාර්යය භාරය

- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තන් හට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමට දක්ෂ තැනැත්තන් බිහි කිරීම සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පිළිබඳ දීර්ඝ පුහුණුවක් ලබා දීම.
- ආයතනයේ ක්‍රියාකාරීත්වය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා පර්යේෂණ සහ අධ්‍යයනවල ප්‍රතිඵල භාවිතා කිරීමේ අරමුණු ඇතිව භාෂා පුහුණු කිරීමට අදාලව පවතින ගැටලු පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යයන පැවැත්වීම.
- සුදුසු තැනැත්තන් හට භාෂා පුහුණුව සහ අධ්‍යාපනය ලබා දීම සහ ඒ පුහුණුවීම සහ අධ්‍යාපනය සම්පූර්ණ කරන සාර්ථක අපේක්ෂකයන්ට සහතිකපත් සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
- භාෂා ඉගැන්වීම කරගෙන යාමට පුහුණු පුද්ගලයන්ගෙන් සමන්විත මණ්ඩලයක් පිහිටුවීම.
- භාෂාවන්ට අදාළ කාරණා පිළිබඳ තොරතුරු තැන්පත් කර තබන ස්ථානයක් පිහිටුවීම.
- භාෂා පරිවර්තකයින්, භාෂණ පරිවර්තනයින් සහ ලඝුලේඛකයින් යනාදි වශයෙන් විශේෂ කාණ්ඩවලට අයත් තැනැත්තන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් විශේෂිත භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම.
- අවශ්‍ය යැයි පෙනී යන අවස්ථාවලදී සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවල තත්ත්වය වැඩි දියුණු කිරීම සහ ඒවාට කළ යුතු වෙනස්කම් පිළිබඳ අදාල අධිකාරියට නිර්දේශ ඉදිරිපත් කිරීම, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා සහ විදේශීය භාෂා පිළිබඳ භාෂාමය පර්යේෂණ කටයුතු කර ගෙන යාම, ඒවාට සහය දැක්වීම සහ ප්‍රවර්ධනය කිරීම.

ආයතනයෙහි ඉහතින් සඳහන් කරන ලද පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා අදාළ සියලු තීරණයන් කළමනාකරණ මණ්ඩලය විසින් ගනු ලබන අතර ආයතනයේ අධ්‍යයන කටයුතු වලට අධ්‍යයන මණ්ඩලය විවිධ අයුරින් සහය දක්වයි. උපදේශක සභාව මගින් ආයතනයේ වර්ධනය උදෙසා ගනු ලබන පියවරවල් වල ඵලදායකත්වය පිළිබඳ ආයතනයට උපදෙස් ලබා දීමත් ආයතනයට අදාල ගැටළු සහ ආයතනයේ සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කිරීමට සාකච්ඡා මණ්ඩලයක් සලසා දීමත් සිදු කරයි.

## 2020 වර්ෂය තුළදී ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද විවිධ පුහුණු පාඨමාලා සහ වැඩසටහන්

අනෙකුත් වර්ෂවලදී මෙන්ම 2020 වර්ෂය තුදීද රාජ්‍ය නිලධාරීන් සඳහා වන භාෂා පුහුණු පාඨමාලා ඇතුළුව මෙම ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන අනෙකුත් පාඨමාලා පැවැත්වීමට සැලසුම් කළද, රටතුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අපේක්ෂා කරන ලද පාඨමාලා ප්‍රමාණය සම්පූර්ණ කිරීමට නොහැකි විය.

කෙසේ වෙතත් මෙම වර්ෂය තුලදී පහත වැඩසටහන් හා ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට හැකියාව ලැබිණ.

**<u>විෂය නිර්දේශ පිළියෙල කිරීම.</u>**

මෙම ආයතනය මගින් රාජ්‍ය නිලධාරීන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන සිංහල දෙමළ භාෂා පුහුණු පාඨමාලාවලට අමතරව, විදේශ භාෂා එනම්, ඉංග්‍රීසි, කොරියන්, හින්දි භාෂාවලට අදාල විෂය නිර්දේශ සහ ස්වාමීන් වහන්සේලා හා පළාත් පාලන නියෝජිතයන් සඳහා වන දෙමළ භාෂා පුහුණු පාඨමාලා වලට අදාල විෂය නිර්දේශය පිළියෙල කිරීම 2020 වර්ෂය තුලදී සිදු කරන ලදි.

**<u>සම්පත්දායකයින් නියාමනය කිරීමේ වැඩසටහන.</u>**

මෙම ආයතනයේ දැනට ලියාපදිංචි සම්පත්දායකයින් අධීක්ෂණය හා නියාමනය කිරීමේ වැඩසටහනක් පළාත් මට්ටමින් 2019 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. කෙසේ වෙතත් රටතුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් එම වැඩසටහන් තුනක් පමණක් 2020 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට හැකි විය.මෙම වැඩසටහන් තුන සඳහා 77 දෙනෙකු සහභාගී වූ අතර ඒ සඳහා රුපියල් 45,000 වැය විය.

**<u>සම්පත් දායකයින් සඳහා වන එක්දින වැඩමුළුව</u>**

මෙම ආයතනයේ සහ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සම්පත්දායකයන් සඳහා පාඨමාලා සම්බන්ධව දැනුවත් කිරීමේ එකදින වැඩමුළුවක් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ එක්ව බොරැල්ල තරුණ බෞද්ධ සමිති ශාලාවේදී පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා සම්පත්දායකයින් 297 දෙනෙකු සහභාගී වන ලද අතර ඒ සඳහා රුපියල් 186,000.00ක මුදලක් වැය විය.

**<u>ගුරු පුහුණු වැඩසටහන්</u>**

ආයතනය මගින් දීප ව්‍යාප්තව සංවිධානය කරණු ලබන භාෂා පුහුණු පාඨමාලාවල ඉගැන්වීමට සුදුසුකම් ලබන්නේ දින 05 නේවාසික ගුරු පුහුණු වැඩසටහනට සහභාගි වී ඉන් සමත්වන ගුරුවරුන් පමණි. මෙම ගුරුවරුන් හෘදයාංගමව බැඳුණු ආවර්ජිත සහභාගීත්ව හා ඉගැන්වීම් ක්‍රියාවලිය (Participatory Reflective Heart Holding Teaching Process) උපයෝගී කරගනිමින් ඉගැන්වීම් කටයුතුවල නිරතවේ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් හට දෙවන භාෂාව ඉගැන්වීමට දක්ෂ ගුරුවරුන් බිහිකිරීමත් සාමාන්‍ය ප්‍රජාවට භාෂා ප්‍රවීණතාවය ලබා දීමට හැකි ගුරු මණ්ඩලයක් බිහි කිරීමත් මෙවැනි වැඩසටහන් පැවැත්වීමෙහි අරමුණයි.

2020 වසර තුළ දී මෙවැනි වැඩසටහනක් දඹුල්ල ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වා ඇති අතර එමගින් සම්පත්දායකයින් 31 දෙනෙකු පුහුණු කර ඇත.

| අනු අංකය | ස්ථානය | පාඨමාලාලාභීන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|
| 1 | දඹුල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 31 | 173,274.19 |
| මුළු එකතුව | | 31 | 173,274.19 |

<u>රාජ්‍ය නිලධාරින් සඳහා පවත්වන දින 06 (පැය 50) නේවාසික නොවන සිංහල /දෙමළ භාෂා පුහුණු වැඩසටහන.</u>

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 1/2014 (IV) දරණ චක්‍ර ලේඛණය මගින් වයස අවුරුදු 50ට වැඩි සහ ප්‍රාථමික ගණයේ සියළු නිලධාරින් පැය 50 ක භාෂා පුහුණු පාඨමාලාවක් හැදෑරිම මගින් භාෂා ප්‍රවීණතා විභාගයෙන් නිදහස් වේ.

2020 මෙවැනි පාඨමාලා දෙකක් පමණක් ක්‍රියාත්මක කරන ලද අතර එමගින් රාජ්‍ය නිලධාරීන් 97 දෙනෙකු සඳහා භාෂා පුහුණුව ලබා දීමට හැකියාව ලැබුණි.

**2020 වර්ෂය තුළ ගාස්තු අයකර ක්‍රියාත්මක කරන ලද දින 6 (පැය 50) භාෂා පුහුණු පාඨමාලා.**

| අනු අංකය | ස්ථානය | පාඨමාලාලාභීන් ගණන | ආදායම(රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|
| 1 | අක්කරෙයිපත්තුව මුලික රෝහල | 37 | 16,550.00 | - |
| 2 | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 60 | 153,000.00 | 90,030.00 |
| මුළු එකතුව | | 97 | 169,550.00 | 90,030.00 |

<u>දින 12 (පැය 100) නේවාසික නොවන සිංහල/දෙමළ භාෂා පුහුණු පාඨමාලා.</u>

සංස්කෘතික හා සමාජ ඒකාබද්ධතාව උදෙසා මානව දයාවෙන් හා සහජීවනයෙන් පිරිපුන් රාජ්‍ය නිලධාරීන් නිර්මාණය කිරීමට ආයතනය ගන්නා අග්‍රගන්‍ය උත්සාහයක් ලෙස මෙම දින 12 කෙටි කාලීන භාෂා පුහුණු පාඨමාලාව හැඳින්විය හැකිය. මෙම පාඨමාලාවට සම්බන්ධවන නිලධාරීන් දින 12ක කාලසීමාවක්

පාඨමාලාව සඳහා සහභාගි වියයුතු අතර පාඨමාලාව අවසානයේ පවත්වනු ලබන විධිමත් ලිඛිත හා වාචික ඇගයීම මත සහතිකපත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014/1V මගින් අවුරුදු 50ට වඩා ඉහළ රාජ්‍ය නිලධාරීන් මෙම ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන පැය 100 පාඨමාලාව හැදෑරීම මගින් භාෂා ප්‍රවීණතා විභාගයෙන් නිදහස්වේ. ඒ අනුව 2020 වර්ෂය තුළ මෙම ආයතනය මගින් පැය 100 පාඨමාලා 3ක් ක්‍රියාත්මක කරන ලද අතර, ඉන් රාජ්‍ය නිලධාරීන් 97 දෙනෙකු සඳහා භාෂා පුහුණුව ලබා දීමට හැකියාව ලැබිණ.

**2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද දින 12 (පැය100) භාෂා පුහුණු පාඨමාලා.**

| අනු අංකය | ස්ථානය | පාඨමාලාලාභීන් ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|
| 1 | නොරච්චෝලේ විදුලි බලාගාරය | 32 | 160,000.00 | 80,780.00 |
| 2 | නොරච්චෝලේ විදුලි බලාගාරය | 33 | 164,975.00 | 78,455.00 |
| 3 | මාතර විදුලි බලාගාරය | 32 | 185,000.00 | 100,550.00 |
| මුළු එකතුව | | 97 | 509,975.00 | 259,785.00 |

<u>**විවිධ වෘත්තිකයන් සඳහා පවත්වනු ලබන පැය 150 භාෂා පුහුණු පාඨමාලා**</u>

විවිධ ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු වෘත්තිකයන් ඉලක්ක කරගෙන මෙම පාඨමාලාව නේවාසික/ අනේවාසිකව ක්‍රියාත්මක කෙරේ. මෙහිදී විශේෂයෙන්ම අලුතින් පත්වීම් ලබන වෛද්‍ය නිලධාරින්, ඉංජිනේරුවන්, රේගු නිලධාරීන්, ශිල්පීය නිලධාරීන් ඇතුළුව විවිධ ක්ෂේත්‍රවල රාජ්‍ය නිලධාරීන් ඇතුලත් වේ.

2020 වර්ෂය තුල නේවාසිකව සහ අනේවාසිකව මෙවැනි පාඨමාලා 13ක් ක්‍රියාත්මක කරන ලද අතර එමගින් රාජ්‍ය නිලධාරීන් 591 දෙනෙකු සඳහා භාෂා පුහුණුව ලබා දීමට හැකියාව ලැබිණ.

**2020 වර්ෂය තුළ ගාස්තු අයකර ක්‍රියාත්මක කරන ලද පැය 150 අනේවාසික භාෂා පුහුණු පාඨමාලා.**

| අනු අංකය | ස්ථානය | පාඨමාලාලාභීන් ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|
| 1 | ඇතුල්කෝට්ටේ විදුලි බලාගාරය | 48 | 480,000.00 | 112,600.00 |
| 2 | දෙහිවල විදුලි බලාගාරය | 62 | 620,000.00 | 94,920.00 |
| 3 | දෙහිවල විදුලි බලාගාරය | 67 | 670,000.00 | 102,530.00 |
| 4 | නොරච්චෝලේ විදුලි බලාගාරය | 35 | 350,000.00 | 123,040.00 |
| 5 | නොරච්චෝලේ විදුලි බලාගාරය | 33 | 330,000.00 | 118,125.00 |
| 6 | නොරච්චෝලේ විදුලි බලාගාරය | 28 | 289,975.00 | 98,400.00 |
| 7 | මාතර විදුලි බලාගාරය | 34 | 340,000.00 | 128,670.00 |
| 8 | ශික්ෂණ රෝහල කළුබෝවිල | 54 | 540,000.00 | 115,273.00 |
| මුළු එකතුව | | 361 | 3,619,975.00 | 893,558.00 |

**2020 වර්ෂය තුළ ගාස්තු අයකර ක්‍රියාත්මක කරන ලද පැය 150 නේවාසික භාෂා පුහුණු පාඨමාලා.**

| අනු අංකය | ස්ථානය | පාඨමාලා ගණන | පාඨමාලාලාභීන් ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|---|
| 1 | වෛද්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලද පැය 150 නේවාසික දෙමළ භාෂා පුහුණු පාඨමාලා-අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය | 3 | 159 | 3,075,000.00 | 1,755,371.00 |
| 2 | ඉංජිනේරු නිලධාරින් සඳහා පවත්වන ලද පැය 150 නේවාසික දෙමළ භාෂා පුහුණු වැඩසටහන - | 2 | 71 | 1,775,000.00 | 887,816.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය | | | | |
| **මුළු එකතුව** | | 5 | 230 | 4,850,000.00 | 2,643,187.00 |

**<u>භාෂා පරිවර්තන ඩිප්ලෝමා පාඨමාලාව</u>**

ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය පනත යටතේ භාෂා හා භාෂා පරිවර්තකයින් පුහුණු කිරීම මෙම ආයතනයේ ප්‍රධාන වගකීම වේ.

ඒ අනුව 2019.05.26 දින මාකුඹුර පිහිටි ප්‍රධාන කාර්යාලයේ දී මෙම පාඨමාලාව ආරම්භ කරන ලද අතර 2020 වර්ෂය තුලදී පාඨමාලාව අවසන් කරන ලදි.

| අනු අංකය | ස්ථානය | පාඨමාලාලාභීන් ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|
| **1** | NILET ප්‍රධාන කාර්යාලය | 20 | 1,057,000.00 | 558,224.00 |
| **මුළු එකතුව** | | 20 | 1,057,000.00 | 558,224.00 |

**<u>හින්දි භාෂා සහතිකපත්‍ර පාඨමාලාව.</u>**

විදේශ භාෂා ඉගැන්වීමේ වැඩපිළිවෙල යටතේ 2020 වර්ෂය තුලදී ආරම්භ කරන ලද මෙම **පාඨමාලාව** සඳහා 15 දෙනෙකු සහභාගී වූ අතර ඉන් 8 දෙනෙකු සාර්ථකව පාඨමාලාව අවසන් කරන ලදි.

| අනු අංකය | ස්ථානය | පාඨමාලාලාභීන් ගණන | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|
| **1** | NILET ප්‍රධාන කාර්යාලය | 15 | 269,500.00 | 184,817.00 |
| **මුළු එකතුව** | | 15 | 269,500.00 | 184,817.00 |

**<u>දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝම පාඨමාලාව</u>**

දෙවන භාෂාව ඉගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරූ පාඨමාලාලාභීන් සඳහා මෙම පාඨමාලාව පැවැත්වේ. ඒ අනුව 2019 වර්ෂය තුල මෙම පාඨමාලාව සඳහා 47 දෙනෙකු ලියාපදිංචි වූ අතර 2020 වර්ෂය තුළද මෙම පාඨමාලාව ක්‍රියාත්මක විය.

**<u>ලියාපදිංචි බලයලත් ආයතන මඟින් ක්‍රියාත්මක කරන ලද භාෂා පුහුණු වැඩසටහන්</u>**

භාෂා ඉගැන්වීමේ කාර්ය වඩාත් පුළුල් කිරීම සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව පෞද්ගලික ආයතන ලියාපදිංචි කරන ලද අතර 2020 වර්ෂය තුල එම ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද පාඨමාලාවන්හි විස්තර පහත දැක්වේ.

| **පාඨමාලාව** | **පාඨමාලා ගණන** | **පාඨමාලාලාභීන් ගණන** |
|---|---|---|
| පැය 50 භාෂා පුහුණු පාඨමාලාව | 1 | 37 |
| පැය 100 භාෂා පුහුණු පාඨමාලාව | 21 | 1,405 |
| **මුළු එකතුව** | 22 | 1,442 |

## <u>6.6 ගිණුම් අංශය</u>

ආයතනයේ සියලුම මූල්‍ය පාලන සහ ගිණුම් කටයුතු සිදු කිරීම ගිණුම් අංශය මඟින් සිදු කරනු ලබයි. ආයතනයේ ප්‍රධාන මූල්‍ය විධායකයා අධ්‍යක්ෂ ජනරාල් වන අතර ගණකාධිකාරී විසින් මූල්‍ය කටයුතු ගිණුම් කටයුතු පිළිබඳ වගකීම දරනු ලබයි.

**<u>ගිණුම් අංශයේ කාර්යයන්</u>**

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට හා ගණන්දීමේ නිලධාරී ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට මූල්‍ය බැඳීම ඉටු කරලීමට සහ පාර්ලිමේතුව වෙත වගවීම දැරීමට සහාය වීම.

- රජයේ මූල්‍ය නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම.

- මූල්‍ය කළමනාකරණය ගිණුම්කරණ පාලන පද්ධතියක් පවත්වා ගෙන යාම.
- අයවැය පුරෝකථනය/ මූල්‍ය සැලසුම් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම.
- කාලීන හා නිවැරදි මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම.
- වර්ෂ අවසාන ගිණුම් සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.
- බදු ප්‍රතිපත්තිවලට හා අනෙකුත් නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම.
- නිසි වේලාවට සේවක වැටුප් හා වේතන ගෙවීම
- ආයතනයේ පවත්වනු ලබන පාඨමාලාවල මූල්‍ය කටයුතු මෙහෙය වීම හා අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කර දීම.

**<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති.</u>**

1. ආයතනික තොරතුරු

   1.1 පිහිටීම සහ නෛතික රාමුව.

   ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය 2007 අංක 26 දරණ පනත යටතේ පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. එහි පුහුණු මධ්‍යස්ථානය ගලේවත්ත, අගලවත්ත යන ලිපිනයේ පිහිටා ඇත.

**2) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**(2.1) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කරනු ලබන අතර සුදුසු පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ සටහන් යටතේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිද යොදාගෙන ඇත.

**(2.2) සංසන්දනාත්මක තොරතුරු**

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කර අවබෝධ කර ගැනීමට අදාළව අවශ්‍ය වන පෙර වර්ෂවල සංසන්දනාත්මක තොරතුරුද මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ. මූල්‍ය ප්‍රකාශනවල ඇති දෑ ඉදිරිපත් කිරීම හෝ නැවත සංශෝධනය කිරීමට ඇති විට ප්‍රවර්ධන වර්ෂය සමග තහවුරු කිඵරීම සඳහා සංසන්දනාත්මක අගයන් නැවත වර්ගීකරණය කර ඇත.

**(2.3) දේපළ, පිරියත, හා උපකරණ**

දේපළ, පිරියත, හා යන්ත්‍රෝපකරණවල අගය, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකමෙන් සමුච්චිත ක්ෂය වටිනාකම් අඩුකළ පසු අගයෙන්, වඩා අඩු අගයකට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ. මෙම වත්කම්වල පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත වටිනාකම්, ඒවායේ ඵලදායී ජීවකාලය තුළ සමානුපාතිකව බෙදීයන පරිදි පහත සඳහන් ක්ෂය අනුපාත මත ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලබයි.

| | අනුපාතය (%) |
|---|---|
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2.5 |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 10 |
| පුස්තකාල පොත් | 10 |
| යන්ත්‍ර සූත්‍ර, පිරියත හා උපකරණ | 20 |
| වාහන | 25 |
| පරිගණක | 25 |

2014 වර්ෂය දක්වා අදාළ වත්කම් මිලදී ගත් වර්ෂයේදී එම සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය වෙන් කරන එම වත්කම් ඉවත් කිරීමේදී ඉවත් කරන සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන් කිරීම සිදු නොකරනු ලබයි. 2014 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් මිලදී ගත් / ඉවත් කළ දිනය පදනම් කර ගෙන ක්ෂය වෙන් කිරීම සිදු කෙරේ.

**(2.4) පාරිතෝෂික සඳහා වෙන් කිරීම**

සේවකයකු සේවයට බඳවා ගත් දින සිට සේවා කාලය වර්ෂයක් සම්පූර්ණ කළ සියලුම සේවා භවතුන්ගේ පෙර ගිණුම් වර්ෂයේ අවසාන මාසයේදී ලබාගත් මාසික වැටුපෙන් භාගයකට සමාන වටිනාකම පදනම් කරගෙන පාරිතෝෂික මුදල් වෙන් කිරීම් සිදු කරනු ලබන අතර 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව පාරිතෝෂික මුදල් ගෙවීමට බැඳීමක් ඇති වන්නේ අවුරුදු 05 ක අඛණ්ඩ සේවා කාලයත් සම්පූර්ණ කළ සේවකයකු සේවයෙන් ඉවත්වීමේදීය.

**(2.5) ලැබිය යුතු ශේෂ**

ලැබිය යුතු ගිණුම් ශේෂ, අපේක්ෂිත උපලබ්දි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර ගිණුම් වර්ෂ අවසානයේදී ලැබිය යුතු ගිණුම් ශේෂවලින් උපලබ්ධි වීම අනපේක්ෂිත අගයන් පුරෝකථනය කරනු ලබයි. බොල් ණය ලෙස හඳුනා ගන්නා ණය ගැති ශේෂ එසේ හඳුනා ගත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම කරනු ලබයි.

**(2.6) මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී, අතැති මුදල්, බැංකු තැම්පතු, බැංකු අයිරා වටිනාකම් යන දෑ මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගන්නා අතර මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා වටිනාකම් පෙන්නුම් කරනු ලබයි.

**(2.7) ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂපත්‍ර දිනට පසු සිදුවී ඇති සිදුවීම්වලින් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇතිකරන සිද්ධීන්වල බලපෑම මූල්‍ය ප්‍රකාශනවල අදාළ පරිදි ගැළපීම් කර ඇති අතර ඇතැම් සිදුවීම් හෙළිදරව් කිරීම් ලෙස ගිණුම්කරණ සටහන් යටතේ දක්වා ඇත.

**(2.8) බැරකම් වෙනුවෙන් වෙන් කිරීම**

මූල්‍ය තත්ව ප්‍රකාශය පිළියෙල කරන දින වන විට නිශ්චිතව ගණනය කළ හැකි සියලු බැරකම් අගය මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වන අතර වටිනාකම නිශ්චිතව නිර්ණය කළ නොහැකි බැරකම් වෙනුවෙන් අවශ්‍ය පරිදි වෙන් කිරීම් සිදු කර ඇත.

**(2.9) සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල වෙනුවෙන් වෙන් කිරීම.**

සේවක භවතුන්හට සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර මණ්ඩල අරමුදල් වෙනුවෙන් හිමිකමක් ඇති අතර පිළිවෙළින් දළ වැටුපෙන් 12% ක් හා 3% ලෙස ආයතනය විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

**(2.10) ආදායම**

**2.10.1) පුනරාවර්ථන ආදායම ලෙස ලැබෙන රාජ්‍ය ප්‍රදාන**

මහා භාණ්ඩාගාරය මඟින් පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ලැබෙන ප්‍රදාන ආයතනයේ ආදායමක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරන අතර, ආයතනයේ සියලු ආදායම්, විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කෙරේ.

### 2.10.2) ප්‍රාග්ධන හා ප්‍රදාන

මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබා දෙන ප්‍රදාන මෙහි ඇතුළත් වන අතර, ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් මෙමඟින් සිදු කරනු ලබයි.

### (2.11) වියදම්

ආයතනය දෛනික කටයුතු පවත්වා ගෙන යාම වෙනුවෙන් දරන පුනරාවර්ථන වියදම් හා ආදායම් උත්පාදිත ක්‍රියාකාරකම් වෙනුවෙන් අදාළ වර්ෂයේදී දරන ලද සියලු වියදම් මේ යටතේ පෙන්නුම් කෙරේ.

### (2.12) තොග

පාඨමාලාවලට අදාළ පොත්පත්, ලිපි ද්‍රව්‍ය ඇතුළු සියලුම තොග අගයන් පිරිවැය වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරේ.

## (3) මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්

### (3.1) ක්ෂය ප්‍රතිපත්ති

2014 වර්ෂය දක්වා ක්ෂය කිරීමේදී අනුගමනය කල මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය වෙන්කිරීමේ හා වත්කම් ඉවත් කරන වර්ෂයේදී එම ඉවත් කරන සම්පූර්ණ වර්ෂයටම ක්ෂය වෙන් නොකිරීමේ ප්‍රතිපත්තිය 2014 වර්ෂයෙන් පසු අදාළ වත්කම් මිලට ගත් දිනය හෝ ඉවත් කල දිනය සලකා ක්ෂය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය දක්වා වෙනස් කර ඇත.

## (4) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී "වක්‍ර ක්‍රමය" අනුගමනය කරන අතර මුදල් හා මුදල් සමාන දෑ තුළ බැංකු ශේෂ / අයිරා වටිනාකම්ද ඇතුළත් කර ඇත.

## 2020/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | සටහන | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 06 | 47,994,529 | 58,271,053 |
| **ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු ශේෂ | 07 | 15,088,531 | 11,171,031 |
| තොග - ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන භාණ්ඩ | | 1,638,812 | 1,270,755 |
| මුදල් හා මුදල් සමාන දෑ | 08 | 72,255,819 | 56,178,156 |
| **සම්පූර්ණ වත්කම්** | | 136,977,691 | 126,890,995 |
| **අරමුදල්, සංචිත සහ බැරකම්** | | | |
| ප්‍රාග්ධනය | | 13,015,468 | 13,015,468 |
| සමුච්චිත අතිරික්ත (හිඟය) | | 57,135,277 | 43,096,339 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 47,000,892 | 47,000,892 |
| | | 117,151,637 | 103,112,699 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික වෙන් කිරීම | | 4,675,348 | 3,712,093 |
| | | 4,675,348 | 3,712,093 |
| **ජංගම බැරකම්** | | | |

| | | | |
|---|---|---|---|
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු වට්නාකම් | 09 | 13,524,317 | 19,130,460 |
| උපචිත වියදම් | 10 | 1,626,389 | 935,743 |
| | | 15,150,706 | 20,066,203 |
| සම්පූර්ණ අරමුදල් සහ බැරකම් | | 136,977,691 | 126,890,995 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය අංගයක් ලෙස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මගින් 2020 දෙසැම්බර් 31 දින වනවිට සහ එහි ගෙවී ගිය වර්ෂය සඳහා වූ අතිරික්තය පිළිබඳ තත්ත්වය සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන බව අපි සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන රජයේ නීති-රෙගුලාසිවල අවශ්‍යතාවන්ට අනුකූල වේ.

ගණකාධිකාරී　　　　　　　　　　　　　　　　　　අධ්‍යක්ෂ ජනරාල්

අංක 1 සිට 3 දක්වා පිටුවල ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය අංගයක් වන අංක 8 සිට 12 දක්වා පිටුවල ඇතුලත් සටහන් කලමනාකරණ මණ්ඩල අනුමැතියට යටත්ව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම ආයතනයේ සභාපතිවරයාගේ වගකීම වේ. අභිනවයෙන් පත්කරන ලද සාමාජිකයන්ගෙන් සමන්විත පළමු කලමනාකරණ මණ්ඩල රැස්වීම සඳහා මූල්‍ය ප්‍රකාශන සහාගත කරනු ලැබේ.

සභාපති　　　　　　　　　　　　　　　　　　කලමනාකරණ මණ්ඩල සාමාජික

දිනය

**2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය**

| | සටහන | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන | 01 | 69,281,000 | 93,925,419 |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන | | - | 5,773,800 |

| | | | |
|---|---|---|---|
| වෙනත් ආදායම් | 02 | 18,852,373 | 44,112,967 |
| | | 88,133,373 | 143,812,186 |
| **වියදම්** | | | |
| පරිපාලන වියදම් | 03 | (69,896,731) | (73,467,406) |
| පුහුණු වැඩසටහන් සඳහා වියදම් | 04 | (10,274,234) | (68,224,969) |
| මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය/(හිඟය) | | 7,962,408 | 2,119,811 |
| මූල්‍ය වියදම් | 05 | (15,540) | (113,639) |
| බදු පෙර අතිරික්තය/(හිඟය) | | 7,946,868 | 2,006,172 |
| බදු | | - | - |
| වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | | 7,946,868 | 2,006,172 |

## 2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | දායක ප්‍රාග්ධනය | සමුච්චිත අතිරික්තය/(හිඟය) | ප්‍රත්‍යා ගණන සංචිත | එකතුව |
|---|---|---|---|---|
| **2018/12/31 දිනට ශේෂය** | 13,015,468 | 41,495,192 | 32,526,407 | 87,037,067 |
| පෙර වර්ෂයේ අනුකූලන | - | (405,025) | - | (405,025) |
| වර්ෂය සඳහා අතිරික්තය (හිඟය) | - | 2,006,172 | 14,474,485 | 16,480,657 |

| | | | | |
|---|---|---|---|---|
| **2019/12/31 දිනට ශේෂය** | 13,015,468 | 43,096,339 | 47,000,892 | 103,112,700 |
| පෙර වර්ෂයේ අනුකූලන | - | 6,092,070 | - | 6,092,070 |
| වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය) | - | 7,946,868 | - | 7,946,868 |
| **2020/12/31 දිනට ශේෂය** | **13,015,468** | **57,135,276.71** | **47,000,892** | **117,151,638** |

**2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | **2020** | 2019 |
|---|---|---|
| | **රු.** | රු. |
| බදු පෙර අතිරික්තය/(හිඟය) | **7,946,868** | 2,006,172 |
| **මූල්‍යමය නොවන සංචලන සඳහා වන අනුකූලන** | | |
| ක්ෂය | **10,365,424** | 11,235,735 |
| පෙර වර්ෂයේ අනුකූලන | **6,092,070** | (405,025) |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | **1,251,155** | 1,171,272 |
| | **25,655,517** | 14,008,153 |
| පොලී ආදායම | **(2,217,173)** | (1,672,783) |
| පාරිතෝෂික ගෙවීම් | **(287,900)** | (183,400) |

| | | |
|---|---|---|
| **කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් අතිරික්තය/(හිඟය)** | **23,150,444** | 12,151,970 |
| **කාරක ප්‍රාග්ධන විචලන** | | |
| වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු වටිනාකම්වල වැඩිවීම/අඩුවීම | **(3,917,500)** | 11,930496 |
| වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු වටිනාකම්වල වැඩිවීම/අඩුවීම | **(4,915,497)** | 15,217,962 |
| තොග අඩුවීම/වැඩිවීම | **(368,057)** | (21,697) |
| | **13,949,389** | 18,842,806 |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **13,949,389** | 18,842,806 |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| දේපළ,පිරියිත හා උපකරණ අත්පත් කර ගැනීම | **(88,900)** | (15,009,728) |
| සිදුකරනු ලබන වැඩ | **-** | 11,276,204 |
| පොලී ආදායම | **2,217,173** | 1,672,783 |
| ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ ලාභය | **2,128,273** | (2,060,742) |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ ප්‍රවාහය | **16,077,662** | 16,782,064 |
| වර්ෂය ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ | **56,178,157** | 39,396,092 |
| වර්ෂය අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ | **72,255,819** | 56,178,156 |

**සටහන අ - මුදල් හා මුදල් සමාන දෑ**

| | | |
|---|---|---|
| | රු. | රු. |
| බැංකුවේ මුදල් | **72,255,819** | 56,178,156 |
| | **72,255,819** | 56,178,156 |

**2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සඳහා වන සටහන්**

| **සටහන 01 - ආදායම්** | 2020 | 2019 |
|---|---|---|
| | රු. | රු. |
| පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රදාන | 61,181,000 | 58,200,419 |
| ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රදාන | | |
| භාණ්ඩාගාරයෙන් ලැබීම් | 8,100,000 | 35,725,000 |
| අමාත්‍යාංශයෙන් ලැබීම් | - | 5,773,800 |
| | 69,281,000 | 99,699,219 |

**සටහන 02 - වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පුහුණු වැඩසටහන් ආදායම් | 16,382,450 | 41,529,813 |
| මිල ගණන් කැඳවීමේ ආදායම් | 45,000 | 93,000 |
| පොලී ආදායම් | 2,217,173 | 1,672,783 |
| වැටුප් රහිත නිවාඩු හා වැටුපෙන් අඩුකිරීම් | 64,175 | 84,093 |
| ශාලා සහ නවාතැන් ගාස්තු | - | 228,340 |
| වෙනත් ආදායම් | 143,575 | 504,938 |
| | 18,852,373 | 44,112,967 |

**සටහන 03 - පරිපාලන වියදම්**

**සේවක වේතන**

| | | |
|---|---|---|
| වැටුප් සහ වේතන | 20,014,086 | 18,675,020 |
| සේ.අ.අ. 12% | 2,401,690 | 2,236,125 |
| සේ.භා.අ. 3% | 600,423 | 558,270 |
| අතිකාල | 52,286 | 143,850 |

| | | |
|---|---|---|
| නිවාඩු දින දීමනා | 26,062 | 62,293 |
| වෙනත් දීමනා | 559,438 | 512,921 |
| වාහන දීමනා | 1,627,586 | 600,000 |
| ඉන්ධන දීමනා | 638,662 | 620,125 |
| පුහුණුකරුවන් සඳහා වන දීමනා | 223,250 | 572,250 |
| සහභාගීත්ව සහ ප්‍රවාහන දීමනා | - | 989,610 |
| සභාපති දීමනා | 775,862 | 713,050 |
| පාරිතෝෂික වියදම් | 1,251,155 | 1,171,272 |
| ප්‍රවාහන - දේශීය | 479,348 | 89,557 |
| ප්‍රවාහන - විදේශීය | - | 207,045 |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 553,868 | 601,180 |
| ඉන්ධන දීමනා | 417,706 | 524,774 |
| නිල ඇඳුම් | 24,000 | 24,000 |
| සංග්‍රහ වියදම් | 90,333 | 195,502 |
| පුවත්පත් සහ වෙනත් | - | 6,271 |
| **නඩත්තු වියදම්** | | |
| වාහන | 544,304 | 1,551,681 |
| පිරියිත සහ යන්ත්‍රෝපකරණ | 358,348 | 329,396 |
| පරිගණක | 57,630 | 211,788 |
| ගොඩනැගිලි | 263,294 | 77,310 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 24,048 | 8,395 |
| **සේවා** | | |
| තැපැල් සහ සන්නිවේදන | 947,348 | 854,518 |
| විදුලිය | 1,074,157 | 1,437,855 |
| ජලය | 132,634 | 179,958 |

| | | |
|---|---|---|
| කුලිය | 16,200,000 | 17,473,750 |
| ප්‍රවාහනය | 95,671 | 97,756 |
| ආරක්ෂක සේවා | 2,478,860 | 2,576,928 |
| පවිත්‍රතා සේවා සහ සහායක කාර්ය මණ්ඩල වියදම් | 2,879,416 | 3,535,597 |
| වෙළෙඳ දැන්වීම් | 101,088 | 536,142 |
| සනීපාරාක්ෂක වියදම් | 522,404 | |
| මෙහෙයුම් හා කල්බදු | 3,557,495 | 3,838,334 |
| විගණන ගාස්තු | 360,000 | 419,090 |
| පරිපාලන සහ සුභ සාධක වියදම් | - | 155,369 |
| වෙනත් | 198,583 | 444,691 |
| **ක්ෂය** | | |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 648,569 | 524,994 |
| පිරියිත යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 2,692,409 | 2,129,742 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1,919,517 | 1,224,557 |
| වාහන | 4,950,000 | 5,332,192 |
| පුස්තකාල පොත් | - | 9,917 |
| පරිගණක | 154,929 | 2,014,312 |
| | 69,896,731 | 73,467,406 |

2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සඳහා වන සටහන්

**සටහන 04 - පුහුණු වැඩසටහන් සඳහා වියදම්**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු. | රු. |
| සම්පත්දායක දීමනා | 2,151,402 | 16,365,034 |
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 452,321 | 3,136,375 |

| | | |
|---|---|---|
| තැපැල් සහ සන්නිවේදන | 354,886 | 757,187 |
| ආහාරපාන සහ සංග්‍රහ වියදම් | 1,611,001 | 9,604,214 |
| නවාතැන් | 116,800 | 743,889 |
| වැඩසටහන් පරිපාලන සහ සම්බන්ධීකරණ ගාස්තු | 36,000 | 698,956 |
| ගුරු අත්පොත් සහ පෙළ පොත් | 240,000 | - |
| සහතිකපත්‍ර සහ අත්පොත් මුද්‍රණ ගාස්තු | 1,325,045 | 6,708,482 |
| සහාය කාර්ය මණ්ඩල සේවා | - | 208,350 |
| අතිකාල | 316,451 | 747,224 |
| නිවාඩු දින ගෙවීම් | 78,889 | 343,551 |
| ඉන්ධන | 400,919 | 953,366 |
| විදුලිය | 396,417 | 971,815 |
| ජලය | 158,731 | 337,310 |
| ප්‍රවාහන - දේශීය | 238,544 | 724,430 |
| වාහන නඩත්තු | 2,850 | 200 |
| පරිගණක නඩත්තු | 1,300 | 3,500 |
| නඩත්තු පිරියත හා යන්ත්‍රෝපකරණ | 68,945 | 62,270 |
| ගොඩනැගිලි නඩත්තු | 24,240 | 71,332 |
| කාර්යාලීය උපකරණ නඩත්තු | 320 | - |
| ප්‍රවාහන සහ සහභාගීත්ව දීමනා | - | 20,130 |
| ගුවන්විදුලි සහ රූපවාහිනී වැඩසටහන් | - | 20,990,247 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | - | 206,300 |
| වෙළෙඳ දැන්වීම් | 48,276 | 829,567 |
| නේවාසිකාගාර සහ කාර්යාලීය අවශ්‍යතා | 87,068 | 237,517 |
| කුලී සහ දේශනශාලා ගාස්තු | 412,305 | 1,080,799 |
| පරිවර්ථන, විභාග සහ උපදේශණ ගාස්තු | - | 50,000 |
| පුහුණුකරුවන් සහ කාර්ය මණ්ඩල දීමනා | 1,616,921 | 2,328,750 |

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | | 8,850 |
| වෙනත් සේවා | 134,603 | 35,326 |
| | 10,274,234 | 68,224,969 |

**සටහන 05 - මූල්‍ය වියදම්**

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 15,540 | 30,000 |
| ඉතුරුම් පොලී මත රඳවා ගැනීමේ බදු | - | 83,639 |
| | 15,540 | 113,639 |

**සටහන 06 - දේපළ පිරියිත හා උපකරණ**

| දේපළ පිරියිත සහ උපකරණ | ක්ෂය අනුපාතය | මුළු පිරිවැය 2020/01/01 | වර්ෂය තුල එකතු කිරීම් | ප්‍රත්‍යා ගණනය | **මුළු පිරිවැය 2020/12/31 දිනට** | සමුච්චිත ක්ෂය 2020/01/01 දිනට | අනුකූලන | වර්ෂය සඳහා ක්ෂය | **සමුච්චිත ක්ෂය 2020/12/31 දිනට** | **W D අගය 2020/12/31 දිනය** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ඉඩම | - | 615,000 | - | - | **615,000** | - | - | - | - | **615,000** |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2.5% | 25,942,745 | - | - | **25,942,745** | 1,682,891 | - | 648,569 | **2,331,460** | **23,611,285** |
| පිරියිත යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 20% | 13,462,046 | - | - | **13,462,046** | 10,630,072 | - | 2,692,409 | **13,322,481** | **139,565** |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 10% | 19,173,793 | 88,900 | - | **19,173,793** | 7,885,032 | - | 1,919,517 | **9,804,549** | **9,458,144** |
| වාහන | 25% | 19,800,000 | - | - | **19,800,000** | 1,586,712 | - | 4,950,000 | **6,536,712** | **13,263,288** |
| පුස්තකාල පොත් | 10% | 1,343,352 | - | - | **1,343,352** | 1,343,352 | - | - | **1,343,352** | **-** |
| පරිගණක | 25% | 8,316,944 | - | - | **7,964,938** | 7,964,938 | - | 154,929 | **8,119,867** | **197,077** |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 88,653,88 0 | 88,90 0 | - | **88,742,78 1** | 31,092,99 8 | - | 10,365,42 4 | **41,458,42 2** | **47,284,35 8** |
| ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සහ අභ්‍යන්තර කාර්යයන් | | | | | | | | | | **710,171** |
| | | | | | | | | | | **47,994,52 9** |

**2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සඳහා වන සටහන්**

| **සටහන 07 - වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු ශේෂ** | 2020 | 2019 |
|---|---|---|
| | රු. | රු. |
| අත්තිකාරම් - ආදායම් | - | 30,000 |
| ලැබිය යුතු ශේෂ - හේවාසිංහ මයා | 58,983 | 58,983 |
| ලැබිය යුතු ශේෂ - තුරම් මයා | 17,163 | 17,163 |
| ලැබිය යුතු ශේෂ - නාපාවල මිය | 9,650 | 9,650 |
| ලැබිය යුතු ශේෂ - වික්‍රමසිංහ මයා | 9,650 | 9,650 |
| වෙබ් අඩවිය සඳහා ගෙවා ඇති අත්තිකාරම් | 93,000 | 93,000 |
| ලැබිය යුතු ශේෂ - තමන්කඩුව ප්‍රා.ලේ.කා. | - | 22,000 |
| ලැබිය යුතු ශේෂ - ලංකා විදුලිබල මණ්ඩලය | 900,000 | 900,000 |
| තැන්පතු | 161,500 | 141,500 |
| ගොඩනැගිලි සඳහා අත්තිකාරම් | 6,519,500 | - |
| ලැබිය යුතු ශේෂ - බුද්ධ ශාසන අමාත්‍යාංශය | 165,000 | 165,000 |
| ලැබිය යුතු ශේෂ - සෞඛ්‍ය අමාත්‍යාංශය | 4,863,800 | 7,433,800 |
| ලැබිය යුතු ශේෂ - රේඛීය අමාත්‍යාංශය | 2,290,285 | 2,290,285 |
| | 15,088,531 | 11,171,031 |

**සටහන 08 - මුදල් හා මුදල් සමාන දෑ**

| | | |
|---|---|---|
| | රු. | රු. |
| ලංකා බැංකුව - C/A 0007442918 | | |

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | 1,465,131 | 309 |
| පුනරාවර්තන ගිණුම | 4,895,320 | 475,102 |
| අමාත්‍යාංශ වැඩසටහන් | 270 | 270 |
| ආදායම් ගිණුම | 3,684,230 | 4,433,782 |
| භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීම | 6,150 | 6,150 |
| ඉතිරිකිරීමේ ගිණුම A/C - BOC 79712746 | 62,204,717 | 51,262,544 |
| | 72,255,819 | 56,178,157 |

**සටහන 09 - වෙළෙඳ සහ වෙනත් ගෙවීම්**

| | රු. | රු. |
|---|---|---|
| ටෙන්ඩර් තැන්පතු - ආපසු ගෙවිය යුතු | 870,600 | 202,000 |
| සම්පත්දායක දීමනා | 5,698,735 | 6,655,048 |
| ඉන්ධන | - | 141,500 |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය | 274,250 | 282,725 |
| තැපැල්, කුරියර්, සන්නිවේදන | - | 128,595 |
| ප්‍රවාහනය - දේශීය | - | 5,862 |
| රඳවා ගැනීම් - ගෙවිය යුතු | - | 72,225 |
| වික්‍රමාරච්චි ඉදිකිරීම් - අගලවත්ත අළුත්වැඩියාව | 637,946 | 637,946 |
| ණය හිමියන් | 324,000 | 2,814,563 |
| WHT ගෙවිය යුතු | - | 13,495 |
| ලීමා ක්‍රියේෂන් - අභ්‍යන්තර සැකසීම් | 2,039,290 | 4,039,290 |
| සේවා ගිවිසුම් - ගෙවිය යුතු | | 44,886 |
| විගණන ගාස්තු - ගෙවිය යුතු | 720,000 | 360,000 |
| ණය හිමියන් - විකාශන සහ දුර විකාශන වැඩසටහන් | 2,959,496 | 2,959,496 |
| වැටුප්, සේ.අ.අ. හා සේ.භා. මණ්ඩල සඳහා වෙන් කිරීම් | - | 772,830 |
| | 13,524,317 | 19,130,460 |

**2020/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය සඳහා වන සටහන්**

**සටහන 10 - උපචිත වියදම්**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු. | රු. |
| දේශීය ගමන් ගාස්තු | 21,420 | - |
| තැපැල් සහ සන්නිවේදන | 145,145 | - |
| විදුලි ගාස්තු | 86,849 | 77,597 |
| ජලය | 3,829 | 2,676 |
| විදුලි ගාස්තු | 48,948 | - |
| ආරක්ෂක සේවා | 218,315 | 221,229 |
| ආහාර සහ සංග්‍රහ | 1,435 | - |
| අතිකාල | 15,000 | - |
| නිවාඩුදින ගෙවීම් | 11,183 | 70,248 |
| අනියම් සහ පුහුණු දීමනා | 256,823 | 9,500 |
| කුලී - ගෙවිය යුතු | 27,305 | - |
| සනීපාරාක්ෂක සේවා | 270,325 | 277,972 |
| පෙළපොත් සහ ගුරු අත්පොත් පිලියෙල කිරීම | 240,000 | - |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ - ගෙවිය යුතු | 226,521 | 226,521 |
| අනෙකුත් උපචිත වියදම් | 53,292 | 50,000 |
| | 1,626,389 | 935,743 |

**සටහන 11 - පෙර වර්ෂයේ අනුකූලන**

| | 2020 | 2019 |
|---|---|---|
| | රු. | රු. |
| 2016 වර්ෂයේ ගෙවන ලද අත්තිකාරම් මුදල් | 6,250,000 | 1,240,907 |
| පෙර වර්ෂයේ ආරක්ෂක බිල්පත් | (174,259) | 5,243,274 |
| වැඩ තහනම් වූ නිලධාරීන් සඳහා වන වෙන් කිරීම් | 16,329 | 1,649,158 |
| | 6,092,070 | 8,133,339 |

**සටහන 13 -ආයතනය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම**

ආයතනයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කරමින් පවතින අතර ඒ සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනය වෙත අත්තිකාරම් මුදලක් ලෙස රු. 93,000ක් ගෙවනු ලැබ ඇත. එම කාර්යය සඳහා වැය වන මුළු මුදල රු. 465,000.00 කි.

**සටහන - 14 - 2019 අයවැය යෝජනාවට අනුව භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීම**

2019 අයවැය යෝජනාවට සහ අමප/19/2693/131/018-I කැබිනට් අනුමැතියට අනුව "භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන" සහ ඊට අදාල රු. 37,395,922.00 අගයක බිල්පත් ලැබීමට නියමිත අතර අවශ්‍ය මුදල් මහාභාණ්ඩාගාරයෙන් ලැබීමට නියමිතය. මෙම වැඩසටහන 2019 වර්ෂයේ පවත්වනු ලැබ ඇත.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිඑල්/සී/එන්අයිඑල්ඊටී/ එෆ්එස්/01/20/71

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 දෙසැම්බර් 21 දින


සභාපති

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

**ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජිවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 12,285,304ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයට විරුද්ධව කම්කරු අධිකරණයේ නඩුවක් පවරා තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව වාර්තා කරන දිනට ඇති අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක්, ප්‍රායෝගික වන්නේ නම් එහි මූල්‍ය බලපෑමේ ඇස්තමේන්තුවක් හා ගෙවිය යුතු කාලය සහ ප්‍රතිපූර්ණය විය හැකි බව පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ)ආයතනය සතු හෙක්ටයාර් 01 ක් පමණ වූ අගලවත්ත පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩමෙහි පිරිවැය වටිනාකම රු. 615,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම ඉඩමෙහි සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූමගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල

වන්නේ ඒවා දූෂ්‍යසන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------------

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනතේ 6 ඡේදයේ (ඊ) වගන්තිය | 2020 දෙසැම්බර් 31 දිනට ඉතුරුම් ගිණුමේ රු.62,204,717ක ශේෂය කලමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන කෙටිකාලීන හා දිගුකාලීන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, මෙම මුදල් ආයෝජනය කිරීමකින් තොරව වර්ෂ කිහිපයක සිටම සාමාන්‍ය ඉතිරිකිරීම් ගිණුමක පවත්වාගෙන ගොස් තිබුණ අතර එම මුදල ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ලබා ගත හැකිව තිබූ ඉහළ පොළී ආදායම අහිමි වී ගොස් තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) හා (3) | 2020 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන් විසින් තැන්පත් කරන ලද ආපසු ගෙවිය යුතු රු.870,600ක් වූ තැන්පතු ශේෂය තුල වර්ෂ02 ක් ඉක්මවූ තැන්පතු වටිනාකම රු.107,000 ක් විය. මෙම තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 21.1 වගන්තිය හා 23.2 වගන්තිය | විධිමත් විනය පරීක්ෂණයක් අප්‍රමාදව හෝ විනය බලධාරියා නියම කරනු ලබන කාල සීමාවක් තුල පවත්වා එකී වාර්තාවෙන් චූදිත නිලධාරියා සියළුම චෝදනාවලින් නිදහස් වී ඇති බව තිරණය කරන්නේ නම්, නැවත සේවයේ පිහිටුවීමේ නියෝගයක්ද, වැඩ තහනම් කළ කාලයේ නොගෙවා සිටි වැටුප් කිසිවක් වේ නම්, ඒවා ගෙවන ලෙසට නියෝග කළ යුතු වුවද එකී කාර්යයන් ඉටු නොකර වැඩ තහනමකට ලක් වූ අධ්‍යක්ෂක ජනරාල්වරයා සහ පරිපාලන නිලධාරිනිය නැවත සේවයේ පිහිටුවා තිබූ අතර, වැඩ තහනමට ලක් වූ කාලයට අදාලව වැටුප් හා දීමනා ලෙස රු. 666,026 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/ 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 13.2 ඡේදය මගින් ඇතුළත් කළ මුදල් රෙගුලාසි 770(4) | මෝටර් රථයක් හා ත්‍රිරෝද රථයක් වසර කිහිපයක් තිස්සේ ධාවනයේ නොයොදවා ආයතන පරිශ්‍රය තුල ගාල්කර පැවති අතර අපහරණය කළ යුතු පාවිච්චි කළ නොහැකි වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඉ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනවලට කාර්යමණ්ඩලය බඳවා ගැනීම් හා වැටුප් හා දීමනා තිරණය කිරීමෙන් වැලකි සිටිය යුතු වුවද, එකී උපදෙස්වලට අනුගත නොවී සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරින් 11 දෙනෙකු බඳවාගෙන රු. 1,726,853 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේබලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් විගණන නිරීක්ෂණ

-----------------------------

(අ)අහෝසි වී ගිය ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 2,290,285ක මුදල වර්ෂ 2කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කර ගැනීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස පෙන්නුම් කර තිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ රු. 13,524,317 ක් වන අතර මෙයින් රු. 11,335,467 ක් වර්ෂ 02කට වැඩි කාලයක සිට පවතින අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2019 වර්ෂයේදී බහුකාර්ය මුද්‍රණ යන්ත්‍රයක් රු. 2,024,000කට මිලදී ගෙන තිබුණි. මෙම මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමේ මූලික අරමුණ සහතිකපත් 50,000 – 100,000 දක්වා වූ ප්‍රමාණයක් මුද්‍රණය කිරීම වුවද, ආයතනයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි තාක්ෂණික පිරිවිතර සකස් නොකර මිලදීගැනීමට කටයුතු කිරීම හේතුවෙන් 2020 වර්ෂයේදි බාහිර ආයතනයක් වෙතින් සහතිකපත් 38000ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු. 1,026,000ක අමතර පිරිවැයක් දරා තිබුණි.

(ඈ) නිසි අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව අහලවත්ත පුහුණු මධ්‍යස්ථානයට 2015 වර්ෂයේදි මිලදීගත් රු. 295,924ක් වටිනා රෙදි සෝදන යන්ත්‍ර දෙක ජීවකාලය අවසන්වන තෙක්ම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. එසේම ආයතනය සතු වාහන 2 ක් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රයෝජනයට නොගෙන ඌණ උපයෝජිතව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති